
# උඩඟු මාළුවා




ඩී එම් මලීෂා සජ්සරණී ජයසේකර

2 වසර A

මහමායා බාලිකා විද්‍යාලය


# පෙරවදන

උඩඟු මාළුවා යන කතා පිංච
මා ඉගෙනුම ලබන මහාමායා
බාලිකා විද්‍යාලයේ 2 ඒ පංති
භාර ගුරුතුමිය වන මංජුලා
සුමනසිංහ ගුරුතුමියට
ගෞරවයෙන් පිළිගන්වමි.




එකමත් එක රටක ගඟක් ළඟ ලස්සන විලක් තිබුණා මේ විලේ මාළු රංචුවක් ජීවත් වුණා.


මේ මාළු අතර ටිකක් ලොකු ලස්සන මාළුවෙක් හිටියා. මේ මාළුවා අනිත් මාළුවන්ට වඩා ලොකු නිසා හරිම ආඩම්බරයෙන් ජීවත් වුණේ.



දවසක් මේ මාළුවා අනිත් මාළුවන්ට කතා කරලා මෙන්න මෙහෙම කිව්වා. “මං වගේ ලස්සන ලොකු මාළුවෙක්ට ඔයාලා වගේ කැත පොඩි මාළුවෝ හරියන් නැහැ. මම මේ වීල දාලා යනවා එහා පැත්තේ ගඟට” ඔයාලා දන්නවාද? “ඒ ගඟ හරීම විශාලයි ඒ වගේම හරීම ලස්සනයි. අනික මේ ඔයාලා දන්නවා ද? මං වගේ ලස්සන මාළුවොන්ට එයාලත් එක්ක සතුටින් ඉන්න පුළුවන්.” ඉතිං මෙහෙම කියලා මේ මාළුවා  ගංවතුරක් එනකන් බලාගෙන හිටියා.



ඔයාලා දන්නවාද? එක කාලයකට මහ විශාල වැස්සක් වහිනවා. ඒ වැස්සට ගඟ ගලලා මේ විලත් යට වෙනවා. එතකොට ගඟයි විලයි දෙකම එකයි. ඉතින් මේ මාළුවා එහෙම දවසක විලෙන් ගඟට පිහිනලා ගියා.



ඊට පස්සේ ගඟේ ලස්සන බල බල පිහිනුවා. හැබැයි මේ ලස්සන තිබුණේ පොඩිම පොඩි වෙලාවයි.


“හෑ.....මෙච්චර ලොකු මාළුවෝ”

අනේ.. අනේ... මං දැන් මොකද කරන්නේ මාළුවා හිස හැරුණු අතේ පීනන්න ගත්තා. පිහිනලා ගිහින් යන්තන් ගලක් අස්සේ හැංගුනා

“අයියෝ මම දැන් මොකද කරන්නේ මෙහෙ මේ තරම් ලොකු මාළුවෝ ඉන්නා කියලා දන්නේ නැහැනේ.”


“අනේ.. එයාලගේ එක කටකටවත් මදිවෙයිනේ. මම හිටපු තැන කොච්චර හොඳද? අනික මගේ පුංචි මාළුවෝ කොච්චර හොඳද?”

අනේ මං කරගත්ත මෝඩකමක් මාළුවා තනියම කල්පනා කර කර දුක් වුණා.




එහෙම දුකින් කල්පනා කර කර ඉන්නකොට පිටිපස්ස බලද්දී තව මාළුවෙක් පිටිපස්සේ ඇවිත් ඉන්නවා දැක්කා.

ඒ පාර මාළුවා බය වෙලා පීනන්න පටන් ගත්තා පීනලා පීනලා ඇවිත් ගඟ පතුලේ හැංගුනා.



මෙහෙම ටික වෙලාවත් ගියා.
ගංවතුර බැහැලා ගියා.
ඉරත් පායාලා තිබුණා.



ටික වෙලාවක් ගියාට පසු මාළුවා බයෙන් බයෙන් ඇස් දෙක ඇරියා.

“අනේ  මේ මම ආපහු ඇවිත් තියෙන්නේ හිටපු තැනටම”

මාළුවාට හරිම සතුටුයි.

මාළුවා අනිත් පුංචි මාළුවෝ එක්ක හරිම ආසාවෙන් සතුටෙන් පීනලා ගියා.

හැබැයි එයාගේ ආඩම්බරකම නම් නැතිකර ගෙන තිබුණා.

පුංචි දුවේ, පුතේ අපට ලැබුණු දෙයින් සතුටු වෙන්න පුරුදු වෙන්න ඕනේ ඒ වගේම අපට ලැබුණු දේවල් ගැන අනිත් අයට ලැබුණු දේවල් ගැන ආඩම්බර වෙන්න හොඳ නෑ.

# පසුවදන

## මේ පොත් පිංචය සැකසීමට මා හට උදව් උපකාර කළ මාගේ ගුරුතුමිය මාගේ

දෙමිපියන් හා මාගේ සහෝදරියන් හට මා ස්තූති වන්න වෙමි.